# සාමාන්‍ය සමයේ විසිනවවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

රෝම 6 :19–23

"ඔබ පාපයෙන් නිදහස ලබා දෙවියන් වහන්සේගේ දාසයන් වූහ."

සහෝදරවරුනි, ඔබගේ තේරුම් ගැනීමේ දුර්වලතා මා දන්නා නිසා නිදර්ශන දක්වමින් ඔබට කතා කරමි. එනම්, ඔබ වරක් අයුතුකම් කරන ලෙස ඔබේ ඉන්ද්‍රියයන් අපිරිසිදුකමේත්, අයුක්තියේත් වහල් සේවයට බාර දුන්නාක් මෙන් දැන් පරිශුද්ධත්වය සඳහා ඔබේ ඉඳුරන් ධර්මිෂ්ඨකමේත් වහල් සේවයට භාර දෙන්න.

ඔබ පාපයට දාසයන් ව සිටිය දී ධර්මිෂ්ඨකමේ නියමයන්ට නොබැඳී සිටියාහු ය. එයින් කුමන් ප්‍රතිඵලයක් ඇති වීද? ඇති වූයේ ඔබ දැන් ලජ්ජාවට පමුණුවන, මරණයෙන් කෙළවර වන ප්‍රතිඵලය යි. එහෙත් දැන් ඔබ පාපයෙන් නිදහස ලබා දෙවියන් වහන්සේගේ දාසයන් ව සිටින බැවින් සදාතන ජීවිතයෙන් කෙළවර වන විශුද්ධි මාර්ගයෙහි පල දරන්නාහු ය. පාපයේ විපාකය මරණය යි. එහෙත් දෙවියන් වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමින් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ සදාතන ජීවනයයි.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 1 : 1-4, 6

පිළිතුර: සමිඳුන් අදහන්නෝ ආසිරි ලද්දෝ ය.

ගීය:

දුදනන් උපදෙස් අනුව නොයන, දෙව්දුන් ගරහන්නන් ඇසුරු නොකරන, සමිඳුන්ගේ විනයෙහි ප්‍රීති ප්‍රමුදිත වන, දිවා රෑ එය භාවනා කරන මිනිසා භාග්‍යවන්තයෙක් වන්නේය.

ඔහු ඇළ දොළ අද්දර පිහිටුවා ඇති, නියම කලට පල දරන කොළ පරවී නොයන ගසකට සමාන ය.
ඔහු කරන සෑම දේ සරුසාර වේ.

පව්ටු දනෝ එසේ නොවෙති. ඔව්හු සුළඟේ යන බොල් හා සමාන වන්නෝ ය.
දැහැමියන් හට සමිඳාණෝ සරණ වන සේක.
පව්ටුන්ගේ මාර්ගය විනාශයට යන්නේ ය.

## සුබසුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ලෝකයේ ආලෝකය මම ය.
මා අනුගාමී වන්නා ජීවනයේ ආලෝකය ලබන්නේ යයි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!

අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිසා
සියලු දේ මට නැති වී ගියා පමණක් නොව,
ඒ සියල්ල කුණු කසල යයි මම සලකමි.
මාගේ කැමැත්තෙන් නම් උන්වහන්සේ අත්කර ගැනීමත්,
උන්වහන්සේ හා ඒකාබද්ධවීමත් ය.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 12: 49–53

"සාමය දෙන පිණිස නොව බේද ඇති කරන පිණිස මම ආවෙමි."

"පොළොව මත ගිනිලන්න ආවෙමි. ගින්න දැනටම ඇවිළී තිබේ නම් කොපමණ හොඳද? මට එක්තරා බෞතීස්ම ස්නාපනයක් ලබන්නට තිබේ. එය ඉටු වෙනතුරු මම දැඩි සිත් වේදනාවෙන් පසු වෙමි. පොළොවෙහි සාමය දෙන පිණිස ආවෙමි"යි ඔබ සිතන්නාහුද? එසේ නොවේ. මා ආවේ භේද ඇති කරවන පිණිස යයි මම ඔබට කියමි.

මෙවක් පටන් එක ගෙදර වසන පස් දෙනෙකුගෙන් දෙදෙනෙකුට විරුද්ධව තිදෙනක් ද තිදෙනෙකුට විරුද්ධව දෙදෙනෙක් ද භේද වන්නෝය. පියා පුතාටත්, පුතා පියාටත්, මව දුවටත්, දුව මවටත්, නැන්දම්මා ලේලිටත්, ලේලිට නැන්දම්මාටත් විරුද්ධව භේද වන්නෝ ය"යි ජේසුස් ස්වාමින් වහන්සේ වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.